දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ ඉල් අව විසේනිය ලත් ශනි දින | කාණ්ඩය 111 | පත්‍රය 302 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 දෙසැම්බර් 05 සෙනසුරාදා





සදාතනික පත්තර තාරුණ්‍යය
යොවුන් ජනතා
අද පත්‍රය සමග

STF ප්‍රධානියා සහ නිලධාරීන් 255ක් නිරෝධායනයට

රුවන්ත නිතුල්ගස්පිටිය

විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා ඇතුළු විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් 256 දෙනකු දින 14ක නිරෝධායන ක්‍රියාවලියකට යොමුකර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාල ඊයේ (04දා) 'දිනමිණ' ට පැවැසීය.

මහර බන්ධනාගාර ගැටුම මැඩපැවැත්වීමට සහභාගී වූ නිලධාරීන් සහ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල කොවිඩ්-19 සම්බන්ධ අවධානම් රාජකාරි හී නියුතුව සිටි නිලධාරීන් පිරිසක් මෙලෙස නිරෝධායනය කඳවුරු වෙත යොමුකර ඇති බවද එම කාර්යාලය කීය. පිට 6

වැලිකඩ බන්ධනාගාරයට හෙරොයින් තොගයක්

STF ආරක්ෂාව නැති වීම හේතුවයි

අප්‍රේල් තෙක් ප්‍රමාණවත් යැයි බන්ධනාගාර ආරංචි මාර්ග පවසයි

රුවන්ත නිතුල්ගස්පිටිය

වැලිකඩ බන්ධනාගාරයේ පිටත ආරක්ෂාවට යොදවා සිටින පොලිස් විශේෂ කාර්ය බළකායේ 17 නිලධාරීන් සියලු දෙනා කොවිඩ් අවදානම හමුවේ සිය රාජකාරිවලින් බැහැරව සිටි පසුගිය කිහිපයක සිට බන්ධනාගාර අභ්‍යන්තරයට විශාල මත්කුඩු තොගයක් ඇතුළු වී තිබෙන බවට ආරතුරු හෙළි වේ. පිට 6

මහර ගැටුමට හේතුව පාතාල කල්ලි

පොළොන්නරුවේ වනජීවී ගැටලුව සොයා බැලීමට කමිටුවක්

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර, සන්ධ්‍යා කරුණාරත්න

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වනජීවී හා වන සංරක්ෂණ අංශයන්ට අදාළව මතුව තිබෙන ගැටලු පිළිබඳ සොයා බැලීම සඳහා කමිටුවක් පත් කිරීමට වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය තීරණය කරයි. පිට 6

ඉන්දීය සාගර කලාපයට පියාසර කරන ලොව ප්‍රමුඛතම ගුවන් සේවය ශ්‍රී ලංකන්

අඛණ්ඩව පස්වැනි වරටත් ලෝක සංචාරක සම්මාන උළෙලේදී පිදුම් ලබයි

මහින්ද අලුත්ගෙදර

ඉන්දීය සාගර කලාපය වෙත පියාසර කරන ලොව ප්‍රමුඛතම ගුවන් සේවය ලෙස ශ්‍රීලංකන් ගුවන් සේවය රුසියාවේ මොස්කව් හිදී පැවැති ලෝක සංචාරක සම්මාන උළෙලේදී අඛණ්ඩව පස්වන වරටත් සම්මානයෙන් පිදුම් ලැබ තිබේ. පිට 6

2015 සිට පොලිස් නිලධාරීන් 15ක් ඝාතනය වෙලා

මහජන ආරක්ෂක අමාත්‍ය රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආචාර්ය සරත් වීරසේකර



ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර

අපරාධ මැඩලීමේ කටයුතුවල නිරතව සිටිය දී, 2015 වර්ෂයේ සිට මේ දක්වා පොලිස් නිලධාරීන් 15 දෙනකු ඝාතනය වී ඇතැයි මහජන ආරක්ෂක අමාත්‍ය රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආචාර්ය සරත් වීරසේකර මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (04) පැවැසීය. පිට 6

අධ්‍යාපනයට වෙන් කළ යුතු මුදල් ප්‍රතිපාදන කප්පාදුව නවත්වන්න

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය

නදී මාණික්කගේ

රටේ දුදරුවන්ගේ අධ්‍යාපනය සඳහා වෙන් කළ යුතු මුදල් ප්‍රතිපාදන කප්පාදුව වහා නවතන ලෙස ආණ්ඩුවට බල කරන බව ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. පිට 6



කොවිඩ් අනතුර තිබියදී වර්ජනය කරන්න එපා

ස්වර්ණා විජේකෝන් සහ නුවන් කොඩිකාර

කොවිඩ් 19 වයිරසයෙන් රට අනතුරකට පත් වී තිබෙන මොහොතක වැඩවර්ජනවල නොයෙදී සිය ඉල්ලීම් සාකච්ඡා මාර්ගයෙන් දිනාගැනීමට කටයුතු කරන්නැයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු දෙනාගෙන් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (04) ඉල්ලා සිටියේය. පිට 6

PHI ලාට කෙළ ගැසූ අටලුගම සැකකරු 18 තෙක් රිමාන්ඩ්

පාණදුර සමූහ කපිල සෝමරත්න

කොවිඩ් පරීක්ෂණය සිදු කරමින් සිටියදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ට කෙළ ගසා උඹලාටත් කොරෝනා බෝ කරනවා යැයි කියමින් තර්ජනය කළ අටලුගම ප්‍රදේශයේ සැකකරු මෙම මස 18 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස පානදුර අතිරේක මහේස්ත්‍රාත් චන්දන කලංසූරිය මහතා පෙරේදා(03) නියෝග කළේය. පිට 6

පිට 6

නීති විරෝධීව ගෙනා කෝටි 4ක කහ යුද හමුදා අත්අඩංගුවට

මහර ගැටුම ඇති කළේ පෙති බීලා ද?

ගබඩාවේ තිබූ ඖෂධ 6ක් ගැන විශේෂඥ වාර්තා ගන්නවා

කොවිඩ් නසන්න සහාය නොදෙනවා නම්

ක්‍රෑර සත්ව ඝාතන නැවැත්වීමට